# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2109/13 - 2019 පෙබරවාරි මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2019.02.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### ජනාධිපතිතුමා විසින් කරනු ලබන ප්‍රකාශනයයි

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන.

වසර 2600කට පෙර ලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම අධ්‍යාත්මික ශාස්තෲන්වහන්සේ වන ගෞතම තථාගත බුදුරජාණන්වහන්සේ විසින් පන්සාළිස් වසක් තුළ සකල ලෝක සත්වයා කෙරෙහි පතල මහා කරුණාවෙන් සහ මෛත්‍රියෙන් යුතුව දේශනා කරන්නට යෙදුන උත්තරීතර ශ්‍රී සද්ධර්මය පළමුවන, දෙවන සහ තෙවන සංගායනාවන්හි දී ගරුතර මහා සංඝයාවහන්සේලා විසින් සංගෘහිත කොට ආරක්ෂා කරන ලද හෙයින් ද, ගෞතම බුදුරජාණන්වහන්සේ තුන් වතාවක් ශ්‍රී ලංකාද්වීපයට වැඩමකොට උතුම් ශ්‍රී සද්ධර්මය දේශනා කර ලද හෙයින් ද, දෙවන පැතිස් මහරජ දවස අනුබුදු මිහිදු මහරහතන්වහන්සේ ශ්‍රී ලංකාවට වැඩමකොට එකී උතුම් බුදු දහම ශ්‍රී ලංකාද්වීපය තුළ ස්ථාපිත කරමින් මහ සඟ පරපුරක් බිහි කළ හෙයින් ද, ශ්‍රී ලාංකේය භික්ෂු පරපුර එම උතුම් ශ්‍රී සද්ධර්මය මුඛ පරම්පරාගතව සුරක්ෂිත කොටගෙන අඛණ්ඩව පවත්වා ගෙන එමින් ව්‍යවහාරික වර්ෂ ක්‍රිස්තු පූර්ව පළමුවන සියවසේ දී වලගම්බා මහරජ දවස මාතලේ අලුලෙන් විහාරයේ දී සම්බුද්ධ භාෂිත ත්‍රිපිටක පාලිය පුස්කොළපත්හි ලේඛනාරූඪ කොට සංරක්ෂණය කරන ලද හෙයින් ද,

එසේ ආරක්ෂා කරගෙන එන ලද උතුම් ශ්‍රී සද්ධර්මය පදනම් කරගෙන ශ්‍රී ලාංකේය අනන්‍යතාව සහශ්‍ර දෙකකට වැඩි කලක් විකාශය වෙමින් පැවති හෙයින් ද, ශ්‍රී සම්බුද්ධ ජයන්තිය නිමිතිකොට ගෙන ශ්‍රී බුද්ධ වර්ෂ 2500 (ක්‍රි.ව. 1956 වර්ෂයේ) දී ශ්‍රී ලංකා රජය විසින් ස්ථාපිත කරන ලද ලංකා බෞද්ධ මණ්ඩලය එකී ත්‍රිපිටක පාලිය සිංහල භාෂා පරිවර්තනයත් සමග මුද්‍රණය කර ඇති හෙයින් ද, ශ්‍රී බුද්ධ වර්ෂ 2358 මැදින් මස 02 (ක්‍රි.ව. 1815 මාර්තු මස 02) දින කන්ද උඩරට රාජධානිය බ්‍රිතානය පාලනයට නතුකර ගැනීම සඳහා ඇතුළත්වන ලද උඩරට ගිවිසුමේ 05 වන වගන්තිය තුළින් බුද්ධ ශාසනය ආරක්ෂාකර පෝෂණය කිරීම රාජ්‍ය පාලකයින්ගේ මුඛ්‍ය වගකීමක් ලෙස භාරගන්නා ලද හෙයින් ද,

ශ්‍රී බුද්ධ වර්ෂ 2428 (ක්‍රි.ව. 1885) දී ශ්‍රී ලංකා රජය විසින් නිර්මාණය කරන ලද බෞද්ධ ධජය ලෝකයේ සෑම රටක් ම පාහේ බෞද්ධ ධජය ලෙස පිළිගැනීමට ලක්ව භාවිතයට පත් වූ හෙයින් ද, ශ්‍රී බුද්ධ වර්ෂ 2521 (ක්‍රි.ව. 1978) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 09 වන ව්‍යවස්ථාව අනුව බුද්ධාගමට ප්‍රමුඛස්ථානය ලබා දෙමින් බුද්ධ ශාසනය සුරක්ෂිතකර පෝෂණය කිරීම රජයේ වගකීමක් ලෙස සහතික කොට ඇති හෙයින් ද,


1A - G 29414 — 372 (2019/02)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී බුද්ධ වර්ෂ 2542 (ක්‍රි.ව. 1999) දී ශ්‍රී ලංකා ජනරජය විසින් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයට ඉදිරිපත් කරන ලද යෝජනාව අනුව ශ්‍රී බුද්ධ වර්ෂ 2544 (ක්‍රි.ව. 2001) සිට ගෞතම බුදුරජාණන්වහන්සේගේ ත්‍රෛමංගල්‍ය දිනයවන වෙසක් පොහොය දිනය ලෝක සැමරුම් දිනයක් ලෙස ප්‍රකාශ කරගන්නා ලද හෙයින් ද, ශ්‍රී බුද්ධ වර්ෂ 2560 වෙසක් (ක්‍රි.ව. 2017 මැයි) මස ශ්‍රී ලංකාවේ පවත්වන්නට යෙදුණු එක්සත් ජාතීන්ගේ වෙසක් දින සැමරුම සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ උළලේ ශ්‍රී බුද්ධ වර්ෂ 2560 වෙසක් මස 14 (ක්‍රි.ව. 2017 මැයි මස 14) වැනි දින මහනුවර ශ්‍රී දළද මාලිගාවේ මහ මළුවේ දී ඒකමතිකව සම්මත කරන්නට යෙදුණු මහනුවර ප්‍රකාශනය අනුව ශ්‍රී ලංකාව බුදු දහමේ කේන්ද්‍රස්ථානය ලෙස පිළිගැනීමට ලක්වූ හෙයින් ද, අනාගත පරම්පරාවන් වෙනුවෙන් එකී උත්තරීතර ධර්මය ආරක්ෂා කරදීම ශ්‍රී ලංකා ජනරජයේ අනුල්ලංඝනීය වගකීමක් බවට පත්ව ඇති හෙයින් ද,

ගෞතම බුදුරජාණන්වහන්සේ විසින් දේශනා කරන්නට යෙදුණු මාතලේ අලුලෙන් විහාරයේ දී පුස්කොළපත්හි ලේඛනාරූඪ කළ ත්‍රිපිටක ධර්මය සහ 1956 වසරේ දී 2500 වන ශ්‍රී සම්බුද්ධ ජයන්තිය සැමරීම නිමිති කොට ගෙන ලංකා බෞද්ධ මණ්ඩලය විසින් සිංහල භාෂා පරිවර්තනය සහිතව මුද්‍රණය කරන්නට යෙදුණ පාලි ත්‍රිපිටකය තුළ ගෞතම බුදුන්වහන්සේ දේශනා කරන්නට යෙදුණු ධර්මය නිර්මල ලෙස අඩංගුව ඇති හෙයින් ද, එකී නිර්මල ධර්මය විකෘති කරමින් බුදු දහමේ හර පද්ධතියට හානි පැමිණවීමට ද, එකී ධර්මයට වැරදි අර්ථකථන ලබා දීමට ද, එකී ධර්මය අවඥාවට ලක් කිරීමට ද යම් යම් තැනැත්තන් කටයුතු කිරීම නිසා එවැනි අධර්මවාදී බලවේගවලින් ත්‍රිපිටක ධර්මය ආරක්ෂාකර ගැනීමේ පරම පවිත්‍ර සහ සැඳහැති චේතනාව පෙරදැරිකොට ගෙන එකී පාලි භාෂාවෙන් සහ සිංහල භාෂාවෙන් ලේඛනාරූඪ කරණු ලැබ ඇති අට්ඨ කථා සහිත ත්‍රිපිටකය ජාතික උරුමයක් බවට මම ප්‍රකාශයට පත් කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 (2) (ඌ) අනුව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව මෙම නියෝගය ප්‍රකාශයට පත් කරමි. තව ද, මා විසින් පත් කරනු ලබන ත්‍රිපිටක සංරක්ෂණ මණ්ඩලයෙහි අනුමැතියකින් තොරව එකී ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීම හෝ සංස්කරණයක් කිරීම හෝ සිදු නොකළ යුතු බවට ද, මම මෙමගින් නියෝග කරමි.

වර්ෂ දෙදහස් දහනවයක් වූ පෙබරවාරි මස 07 වැනි දින කොළඹ දී අත්සන් කරදෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**උදය ආර්. සෙනෙවිරත්න,**
ජනාධිපති ලේකම්.

02 - 749

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.